**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ)**
**எதிர்க்ட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்**
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition – Parliament of Sri Lanka

2023.08.04

**මිහින්තලේ විදුලිබිල ගෙවීම පිළිබඳව විපක්ෂ නායකතුමා නිකුත් කළ නිවේදනය.**

මෙරටට බුදු දහම රැගෙන පැමිණි මිහිඳු හිමියන්ගේ පාදස්පර්ෂයට පත් වූවාවූ ඓතිහාසික මිහින්තලේ රජමහා විහාරස්ථානයට දැවැන්ත විදුලි බිලක බරක් ආණ්ඩුව විසින් පටවා තිබූ අතර ඒ හේතුකොටගෙන විහාරස්ථානයේ විහාරාධිපතීන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නය ද, සියලු බැතිමතුන්ද බලවත් පීඩනයකට සහ අපහසුතාවයකට ලක් වූහ.

මේ තත්ත්වය පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමුවූ අතර පසුගිය දා මිහින්තලේ විහාරස්ථානයට පැමිණි අවස්ථාවේදී ගරු නායක මාහිමිපාණන් වහන්සේ මුනගැසී අප පොරොන්දු වූයේ අදාළ විදුලි බිල ගෙවා දමන බවට සහ ඉදිරි පෙරහැර කටයුතු වලට වැයවන විදුලි බිලද ගෙවන්නට කටයුතු කරන බවට ය. එසේ සාකච්ඡා කොට දින දෙකක් යන්නටත් මත්තෙන්, ආණ්ඩුව විසින් මිහින්තලා පුදබිමේ විදුලිය කප්පාදු කර දමන්නේ සිය වෛර මිතුරන්ගේ නිවාස වල වසර ගණන් එකතු වූ නොගෙවූ බිල් පත් තිබියදී එම නිවාස වල විදුලිය විසන්දි කිරීමට සිතුවිල්ලකින්වත් උත්සුක නොවන පසුබිමක සිටයි.

වචනය ක්‍රියාවෙන් ඔප්පු කිරීම අපගේ ප්‍රතිපත්තිය වන අතර නායක මාහිමිපාණන් වහන්සේ බැහැ දැක අප විසින් ලබා දුන් පොරොන්දුව දෙදිනක් තුළ ඉටුකරමින් ඓතිහාසික මිහිනතලේ රජමහ විහාරස්ථානයේ රුපියල්. ලක්ෂ 41 ක්වූ විදුලි බිල සමගි ජන බලවේගයේ සාමාජිකයන්ගේ හා ධානපතීන්ගේ පරිත්‍යාගයන්ගෙන් ගෙවා දැමීමට කටයුතු කළ බව සඳහන් කරමි.

රටක ශිෂ්ටාචාරයක් පෝෂණය කළ ඓතිහාසික කේන්ද්‍රස්ථානයකින් සිදුවන ආගමික, සංස්කෘතික සහ සමාජයීය මෙහෙවර වචනවලින් සීමා කළ නොහැකි අතර එවැනි ස්ථාන උදෙසා හැකි පමණ සහයෝගය ලබා දීම අපගේ වගකීමක් බවද සඳහන් කරනු කැමැත්තෙමි.

අවස්ථාවාදය උදෙසා පමණක් ආගම දහම, ඉතිහාසය මෙන්ම සංස්කෘතිය ද යොදා ගන්නා ආණ්ඩුව සිය සැබෑ ස්වරූපය ඔප්පුකොට ඇත්තේ මෙවැනි ආගමික සිද්ධස්ථාන අරභයා ක්‍රියාත්මක කෙනෙහෙලිකම් තුලින් වන අතර අපි ආණ්ඩුවට අවධාරණය කරන්නේ මෙවැනි බියගුලු සහ අන්තනෝමතික කටයුතු ඔස්සේ බෞද්ධාගමික සහ අනෙකුත් ආගමික ස්ථානවලට කරනු ලබන කෙනෙහිලිකම් වහා නවත්වන ලෙසයි.

**සජිත් ප්‍රේමදාස**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாக்கஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephones: 011 2699171, 011 2699204
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E – mail: sajith_p@dialogsl.net, oppositionleader.sp@gmail.com